නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

# සඞ්ඛාර

පෙළ - අටුවාවන්හි විවිධ ධර්මාර්ථ ගෙන දෙන පද අතර "සඞ්ඛාර" පදය ද නානාවිධ අර්ථයන්ගෙන් දේශනා පාළියෙහිත් අටුවාවන්හිත් සඳහන් ව ඇත්තේ ය. ඒ නිසා එම අර්ථ නිවැරදි ව දැනගෙන යෙදෙන තැනට අනු ව නිවැරදි ලෙස අර්ථය ගළපා ගත යුතු ය. අටුවාවන්ට අනු ව "සංඛාර" පදය අර්ථ හතරකින් ප්‍රධාන ලෙස යෙදී ඇත.

**(1.)** **සඞ්ඛත<u>සඞ්ඛාර</u>** - හේතු-ඵල අනුව සැකසුණු අචිත්තක - සචිත්තක සෑම දෙයක් ම "සඞ්ඛතසංඛාර" ගණයට අයත් වේ. "සබ්බේ සඞ්ඛාරා අනිච්චා" යන බුද්ධ වචනයෙහි සඞ්ඛාර යන්නෙන් දැක්වෙන්නේ අචිත්තක වූ ද සචිත්තක වූ ද හේතූන් නිසා හටගත් "සඞ්ඛතසංඛාර" පිළිබඳ ව ය.

**(2.)** **අභිසඞ්ඛත<u>සඞ්ඛාර</u>** - චේතනාත්මක ව කුසලාකුසල කර්ම රැස්වීම නිසා එහි ඵලයක් හැටියට නැවත නැවතත් හටගන්නා පඤ්චුපාදනස්කන්ධය "අභිසඞ්ඛතසඞ්ඛාර" ය. පටිච්චසමුප්පන්න වශයෙන් හටගන්නා සත්වයාගේ පැවැත්මට අයත් සෑම දෙයක්ම, එනම්, පඤ්චුපාදනස්කන්ධය "අභිසඞ්ඛතසඞ්ඛාර" ගණයෙහි ලා සැලකිය හැකි ය. (මෙහි දී විශේෂයෙන් ම අදහස් කෙරෙන්නේ කර්ම විපාක වශයෙන් ලැබෙන විපාක සිත් **32**, එම සිත්වල යෙදෙන චෛතසික **35** සහ කර්මජ රූප **20** ය.)

**(3.)** **අභිසඞ්ඛරණ<u>සඞ්ඛාර</u>** - පඤ්චුපාදනස්කන්ධයේ පැවැත්ම නැවත නැවතත් සකස් කරන්නා වූ පුඤ්ඤාභිසඞ්ඛාර (පින්), අපුඤ්ඤාභිසඞ්ඛාර (පව්), ආනෙඤ්ජාභිසඞ්ඛාර (අරූපාවචර සමාපත්ති) යන කුසලාකුසල චේතනා අභිසඞ්ඛරණසඞ්ඛාර නම්. එමෙන් ම මෙය කායසඤ්චේතනා හෙවත් කායසඞ්ඛාර (කායද්වාරයෙන් සිදු කෙරෙන කුසලාකුසල කර්ම), වචීසඤ්චේතනා හෙවත් වචීසඞ්ඛාර (වාග්ද්වාරයෙන් සිදු කෙරෙන කුසලාකුසල කර්ම), මනෝසඤ්චේතනා හෙවත් චිත්තසඞ්ඛාර/මනෝසඞ්ඛාර (මනෝද්වාරයෙන් සිදු කෙරෙන කුසලාකුසල කර්ම) වශයෙන් ද සූත්‍ර දේශනාවන්හි දැක්වේ. අභිධර්මයෙහි සූවිසිප්‍රත්‍ය විභාගයෙහි 'කම්මපච්චය' යටතේ 'නානාක්ෂණික' චේතනා විසි නවය ලෙස දැක්වෙන්නේත් මෙම කුසලාකුසල කර්ම පිළිබඳ ව ය. එමෙන් ම පටිච්චසමුප්පාදයෙහි 'අවිජ්ජාපච්චයා සඞ්ඛාරා' යන තැන 'අවිද්‍යාව නිසා ඇති වන සංස්කාර' යනු අනෙකක් නොව මෙම කුසලාකුසල කර්මයන් ම ය.

මෙම අභිසඞ්ඛරණ කෘත්‍යය (එනම්, කුසලාකුසල කර්ම රැස්වීම) සඳහා පාදක වන්නේ සඞ්ඛාරූපාදනස්කන්ධයට අයත් <u>'චේතනාව'</u> යි. සඞ්ඛාරූපාදනස්කන්ධය යනු චෛතසික දෙපනස **(52)** අතරින් වේදනා, සඤ්ඤා චෛතසික දෙක හැර <u>චේතනාව</u> ප්‍රධාන සෙසු කුසල - අකුසල - අව්‍යාකෘත චෛතසික පනහ ය.

ඒවා නම්,

<u>**අන්‍යසමාන චෛතසික 13 (අව්‍යාකෘත).**</u>

<u>(අ) සබ්බචිත්තසාධාරණ චෛතසික 7</u>

**1.** ඵස්ස - (ස්පර්ශය - ආයතන, අරමුණු හා සිත එකතු කරවන, සම්බන්ධ කරවන ගතිය)
**2.** වේදනා (විඳීම)
**3.** සඤ්ඤා (හැඳිනීම)
} මෙය වේදනාස්කන්ධය හා සඤ්ඤාස්කන්ධය ලෙස වෙන්ව ගනු ලැබේ.
**4.** චේතනා - (කාය - වාග් - මනෝ ක්‍රියා සිදු කිරීමේ උත්සාහය)
**5.** ඒකග්ගතා - (සිත අරමුණෙහි නො සැලෙන පරිදි පිහිටුවන ගුණය)
**6.** (නාම) ජීවිතින්ද්‍රිය - (චිත්ත, චෛතසිකයන්ගේ ජීවත් වීමේ ශක්තිය)
**7.** මනසිකාර - (සිත අරමුණෙන් ඉවත් වන්නට නො දී නැවත නැවත අරමුණෙහි යොදවන ගුණය)

<u>**(ආ) ප්‍රකීර්ණක චෛතසික 6**</u>

**8.** විතක්ක - (අරමුණට සිත නංවන ගුණය)
**9.** විචාර - (විතක්කය ගත් අරමුණෙහි හැසිරෙන, පැතිරෙන ගුණය)
**10.** අධිමොක්ඛ - (අරමුණේ ස්වභාවය විනිශ්චය කර ගන්නා ගුණය)
**11.** විරිය - (නො පසුබස්නා බව)
**12.** පීති - (සිත තුටු වන ප්‍රමුදිත වන ගුණය)
**13.** ඡන්ද - (ඒ ඒ දේ කරනු කැමැත්ත)

**අකුසල චෛතසික 14.**

14. මෝහ - (අරමුණෙහි සැබෑ තත්වය වසන ගතිය)
15. අහිරික - (පාපය පිළිකුල් නො කරන ස්වභාවය)
16. අනොත්තප්ප - (පාපයට බිය නො වන ගතිය)
17. උද්ධච්ච - (අරමුණෙහි මැනවින් නො පිහිටා සිත සැලෙන ගතිය)
18. ලෝභ - (අරමුණෙහි ඇලෙන ගතිය)
19. දිට්ඨි - (වරදවා දකින ස්වභාවය)
20. මාන - (තමා ගැන මැන ගන්නා ස්වභාවය)
21. දෝස - (අරමුණ හා ගැටෙන, විරුද්ධවන ස්වභාවය)
22. ඉස්සා - (අනුන්ගේ සැපතට නො කැමති බව)
23. මච්ඡරිය - (තමා සතු දේ අනුන් සතු වීමට අකැමති බව)
24. කුක්කුච්ච - (කළ පව් හා නො කළ පින් ගැන පසු තැවෙන ගතිය)
25. ථීන - (සිතෙහි දුබල බව, අලස බව)
26. මිද්ධ - (චෛතසිකයන්ගේ දුබල බව, අලස බව)
27. විචිකිච්ඡා - (අරමුණ පිළිබඳ සැකය)

**ශෝභන චෛතසික 25 (කුසල).**

**(I) ශෝභනසාධාරණ චෛතසික 19**

28. සද්ධා - (තෙරුවන් හා කුසල ධර්මයන් කෙරෙහි ඇතිවන ප්‍රසාදය, විශ්වාසය)
29. සති - (සිහිය)
30. හිරි - (පාපය පිළිකුල් කරන ලජ්ජා වන ස්වභාවය)
31. ඔත්තප්ප - (පාපයට බිය වන ස්වභාවය)
32. අලෝභ - (අරමුණෙහි නො ඇලෙන ස්වභාවය)
33. අදෝස - (මෛත්‍රිය)
34. තත්‍රමජ්ඣත්තතා - (චිත්ත, චෛතසිකයන් සම ව - මධ්‍යස්ථ ව පවත්වන ගුණය)
35. කායපස්සද්ධි - (චෛතසිකයන්ගේ සන්සුන් බව)
36. චිත්තපස්සද්ධි - (සිතෙහි සන්සුන් බව)
37. කායලහුතා - (චෛතසිකයන්ගේ සැහැල්ලු බව)
38. චිත්තලහුතා -(සිතෙහි සැහැල්ලු බව)
39. කායමුදුතා - (චෛතසිකයන්ගේ මොළොක් බව)
40. චිත්තමුදුතා - (සිතෙහි මොළොක් බව)
41. කායම්මඤ්ඤතා - (චෛතසිකයන්ගේ කර්මණ්‍ය බව)
42. චිත්තම්මඤ්ඤතා - (සිතෙහි කර්මණ්‍ය බව)
43. කායපාගුඤ්ඤතා - (ඒ ඒ ක්‍රියා විෂයෙහි චෛතසිකයන්ගේ හුරු බව)
44. චිත්තපාගුඤ්ඤතා - (සිතෙහි හුරු බව)
45. කායුජ්ජුකතා - (චෛතසිකයන්ගේ ඍජු බව)
46. චිත්තුජ්ජුකතා - (සිතෙහි ඍජු බව)

**(I) අසාධාරණ ශෝභන චෛතසික 6**

47. සම්මා වාචා - (වචී දුශ්චරිත වලින් වළක්නා ස්වභාවය)
48. සම්මා කම්මන්ත - (කාය දුශ්චරිතවලින් වළක්නා ස්වභාවය)
49. සම්මා ආජීව - (දිවි පැවැත්ම සඳහා කරන කාය, වාග් දුශ්චරිතවලින් වළක්නා ස්වභාවය)
    මෙම චෛතසික තුන 'විරති' නමින් හැඳින්වේ.

50. කරුණා - (අනුන්ගේ දුකෙහි සිත කම්පා වන බව)
51. මුදිතා - (අනුන්ගේ සැපතෙහි සතුටු වීම)
    අප්‍රමාණ සත්වයන් අරමුණු කොට ඇති බැවින් මෙම චෛතසික දෙක 'අප්පමඤ්ඤ' (අප්‍රමාණ්‍ය) නමි.

52. පඤ්ඤා - (විද්‍යාව, අමෝහය)

වේදනා, සඤ්ඤා චෛතසික දෙක හැර චේතනාව ප්‍රධාන සෙසු චෛතසික සියල්ල සඞ්ඛාරූපාදනස්කන්ධය යි.

**(4.)** **පයෝගාභි<u>සඞ්ඛාර</u>** - එනම් 'වීර්‍යය' හැඳින් වීමට යෙදෙන තවත් පදයකි.

මේ හැර "සඞ්ඛාර" පදය යෙදෙන තවත් තැන් කිහිපයක් පෙළ - අටුවා ඇසුරින් දත හැකි ය.

✶ **ඉද්ධාභි<u>සඞ්ඛාර</u>** - සෘද්ධි ප්‍රාතිහාර්‍යය පෑම.

✶ **ආශ්වාස - ප්‍රශ්වාස ආදි කායසඞ්ඛාර**

කයේ පැවැත්මට මූලික වන කය හා බැඳී ඇති ආශ්වාස - ප්‍රශ්වාස දෙක කාය<u>සඞ්ඛාර</u> නමින් ද වචනය හා බැඳී ඇති විතක්ක - විචාර දෙක වචී<u>සඞ්ඛාර</u> නමින් ද සිත හා බැඳී ඇති සඤ්ඤා - වේදනා දෙක චිත්ත<u>සඞ්ඛාර</u> නමින් ද සූත්‍ර දේශනාවන්හි දක්වේ. මෙයින් අදහස් කෙරෙන්නේ කර්ම රැස්වීමක් පිළිබඳව නොව කාය, වාග්, මනෝ ද්වාරයන්හි ක්‍රියාවට උපකාර වන ධර්මතාවයන් පිළිබඳ ව ය. විශේෂයෙන් ධ්‍යාන සමාපත්ති විෂය ගැන කථා කෙරෙන විට සඳහන් වන කායසඞ්ඛාර, ආශ්වාස - ප්‍රශ්වාස ය. ඒ ඒ ධ්‍යාන, සමාපත්තීන්හි දී මෙම ආශ්වාස - ප්‍රශ්වාසාදි කායසඞ්ඛාරවල යෙදීම මෙසේ වටහා ගත යුතු ය.

*1.* ප්‍රථම ධ්‍යානය - ආශ්වාස - ප්‍රශ්වාස (කායසඞ්ඛාර)
විතක්ක - විචාර (වචීසඞ්ඛාර)
සඤ්ඤා - වේදනා (චිත්තසඞ්ඛාර) යන ත්‍රිවිධ සඞ්ඛාරවලින් යුක්ත ය.

*2.* ද්විතීය ධ්‍යානය හා *3.* තෘතීය ධ්‍යානය } ආශ්වාස - ප්‍රශ්වාස (කායසඞ්ඛාර)
සඤ්ඤා - වේදනා (චිත්තසඞ්ඛාර) යන දෙවැදෑරුම් සඞ්ඛාරවලින් යුක්ත ය.
(විතක්ක - විචාර සන්සිඳී ඇත.)

*4.* චතුර්ථ ධ්‍යානය හා අරූපාවචර සමාපත්ති } **(ආනෙඤ්ජ සමාධි)** - සඤ්ඤා - වේදනා (චිත්තසඞ්ඛාර) යන සඞ්ඛාරවලින් යුක්ත ය.
(කායසඞ්ඛාර හා වචීසඞ්ඛාර සන්සිඳී ඇත.)

*5.* සඤ්ඤාවේදයිත නිරෝධය - (නිරෝධ සමාපත්තිය) ආශ්වාස - ප්‍රශ්වාසාදි කායසඞ්ඛාරත් විතක්ක - විචාරාදි වචීසඞ්ඛාර හා සඤ්ඤා - වේදනාදි චිත්තසඞ්ඛාරත් සන්සිඳී ඇත.

පටිච්චසමුප්පාද දේශනාවන් හි දක්වෙන කායසඞ්ඛාරාදිය කුසලාකුසල කර්මයෝ ය. එයින් අදහස් වනුයේ මෙම ආශ්වාස - ප්‍රශ්වාස සංඛ්‍යාත කායසඞ්ඛාරාදිය පිළිබඳ ව නො වේ. ආශ්වාස - ප්‍රශ්වාසාදි කායසඞ්ඛාරවලින් දක්වෙන්නේ ද පටිච්චසමුප්පාද දේශනාවට අයත් කායසඞ්ඛාර නො වේ. වචී සඞ්ඛාර, චිත්තසඞ්ඛාර පිළිබඳ ව ද එසේ ම ය.

මෙසේ පෙළ අටුවාවන්හි එන පරිදි "සඞ්ඛාර" යන පදයෙහි නිවැරදි අර්ථ වටහා ගැනීම නිර්වාණාවබෝධයට දොර විවර කරන්නකි. ශ්‍රැතය තුළින් නිවැරදි ලෙස ධර්මය උගෙන නිවැරදිව ප්‍රත්‍යක්ෂ කර ගැනීමට නුවණැති සත්පුරුෂයෝ වෑයම් කරත්වා.

**සාධු ! සාධු !! සාධු !!!**

*(2004 වර්ෂයේ සම්පාදිත "<u>සඞ්ඛාර</u>" පිළිබඳ ධර්ම පත්‍රිකා දෙක මෙම ධර්ම පත්‍රිකා ව අනු ව සංශෝධනය විය යුතු බව කරුණාවෙන් සලකන්න.)*

ආශ්‍රිත ග්‍රන්ථ -

- මජ්ඣිමනිකාය
- සංයුත්තනිකාය
- මජ්ඣිමනිකායට්ඨකථාව
- සංයුත්තනිකායට්ඨකථාව
- පටිච්චසමුප්පාද විවරණය } අතිපූජනීය රේරුකානේ චන්දවිමල මහා නා හිමි.
- අභිධර්ම මාර්ගය } අතිපූජනීය රේරුකානේ චන්දවිමල මහා නා හිමි.
- සතර සතිපට්ඨානය - අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්ද්‍රයන් වහන්සේ.

ශ්‍රී සද්ධර්ම සංසදය
ධම්මාරාම යෝගාශ්‍රමය
(<u>බක් 2548</u>)

❖ *අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්ද්‍රයන් වහන්සේ ගේ ධර්ම දේශනා ඇතුළු පටිගත කරන ලද ධර්ම දේශනා සහ පසුගිය දහම් ලිපි* **www.sadaham.net** *යන වෙබ් අඩවිය ඔස්සේ ලබාගත හැකි ය.*

**<u>Copyright © Sri Saddharmma Sansadaya, Dhammarama Yoashramaya. 2005</u>**